# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය- 15 වන සතිය

විෂය:- පෙරදිග සංගීතය.

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

## චිත්‍රපට සංගීතය

චිත්‍රපටය වූකලි කිසියම් සමාජ විවරණයක් හෝ සොබා දහමේ යම් පැතිකඩක් හෝ පිළිබඳ ව නිර්මාණය කරනු ලබන ශ්‍රව්‍ය දෘශ්‍ය කලා මාධ්‍යයකි. මෙහි දැක්වෙන රූප රාමු මඟින් හෙළි කරන කතා පුවත රසිකයාට වඩාත් සමීප කරවන්නේ සංගීතය ප්‍රබල මෙවලමක් ලෙස යොදා ගනිමිනි. එබැවින් චිත්‍රපට තේමා සංගීතය, පසුබිම් සංගීතය, ගී තනු නිර්මාණය ආදී පුළුල් ක්ෂේත්‍ර ඔස්සේ සංගීත අධ්‍යක්ෂණය කිරීමට සංගීත නිර්මාණ ශිල්පියාට සිදු වේ. සංගීත නිර්මාණ ශිල්පියාගේ ශිල්පීය කුසලතාව මත නිර්මාණයේ සාර්ථකත්වය රඳා පවතී.

1947 වර්ෂයෙන් ආරම්භ වූ ලාංකේය චිත්‍රපට කර්මාන්තයේ ආරම්භය දකුණු ඉන්දීය චිත්‍රපට නිෂ්පාදකවරුන්, ගායක - ගායිකාවන්, සංගීත අධ්‍යක්ෂවරුන්, වාද්‍ය ශිල්පීන් හා ඉන්දීය චිත්‍රාගාර පසුබිම් කොට ගෙන මුල දී සිංහල චිත්‍රපට බිහි වූ නිසා ඒවා බොහෝ දුරට ද්‍රවිඩ චිත්‍රපට අනුකරණ විය.

1947 - 1957 තෙක් මුල් දශකය තුළ චිත්‍රපට 39ක් බිහි වූ අතර, මින් 29ක් ම දකුණු ඉන්දියාවේ නිර්මාණය වූ ඒවා ය.

**මුල් යුගයේ චිත්‍රපට නිර්මාණකරණයට දායක වූ ඉන්දීය නිර්මාණ කරුවෝ**

| සංගීත අධ්‍යක්ෂවරු | ගායක ගායිකාවන් |
|---|---|
| T. R. පාපා | ජමුනා රාණි |
| S. S. වේදා | K. රාණි |
| S. දක්ෂිණ මූර්ති | සරෝජා |
| C. N. පාණ්ඩුරංගන් | සත්‍යවතී |
| R. නාරායන් අයියර් | ලතා මංගේෂ්කාර් |
| | A. M. රාජා |

මුල් යුගයේ ලාංකේය සංගීත අධ්‍යක්ෂවරු, ගායක - ගායිකාවෝ

| සංගීත අධ්‍යක්ෂවරු | ගායක ගායිකාවන් |
|---|---|
| මොහොමඩ් ගවුස් | මොහිදීන් බෙග් |
| R. මුත්තුසාමි | රුක්මණී දේවි |
| B. S. පෙරේරා | W. D. ඇල්බට් පෙරේරා (අමරදේව) |
| R. A. චන්ද්‍රසේන | එඩී ජයමාන්න |
| P. L. A. සෝමපාල | වසන්තා සන්දනායක |
| | ධර්මදාස වල්පොල |
| | ලතා වල්පොල |
| | G. S. B. රාණි |

| සංගීත අධ්‍යක්ෂවරයා | චිත්‍රපටය | ගීතය |
|---|---|---|
| මොහොමඩ් ගවුස් (ගවුස් මාස්ටර්) | අශෝකමාලා | ශාන්ත මේ රාත්‍රියේ |
| R. මුත්තුසාමි | මාතලන් | සිරිනි සරුසර විලා<br>රන්වන් දූල් කරලින් පැසිලා<br>උපත ලබා මේ ලෝකේ<br>ඉවසනු හදේ<br>සඳ රාහු මුඛයේහී<br>දොයි දොයි දොයි දොයිය පුතා |
| ආනන්ද සමරකෝන් | සුජාතා, සැඩ සුළං | මනරංජන දර්ශනීය<br>මා ප්‍රියාදර ජයභූමි |
| B. S. පෙරේරා | පෙරකදෝරු බෑණා | ආදර නදිය ගලා |
| සුනිල් සාන්ත | රේඛාව | සුදු සඳ එළියේ<br>වෙසක් කැකුළු<br>ඕළු නෙළුම් නෙරිය රඟාලා |

කුරුලු බැද්ද, සිකුරු තරුව, සුදෝ සුදු, සාමා, සාරවිට, සැනසුම කොතැන ද, රන්සළු, සීතල වතුර, ගොළු හදවත ආදී නිර්මාණ රේඛාව බිහි කළ ප්‍රවණතාවට අනුගත වූ බව සැලකිය හැකි ය.

රන්මුතුදූව, ගැටවරයෝ, රැන ගිරව්, ආදරවන්තයෝ, නාරිලතා ආදී චිත්‍රපට සංදේශය බිහි කළ ප්‍රවණතාවයට අනුගත වූ බව සැලකිය හැකි ය.

ප්‍රේමසිරි කේමදාස, සෝමදාස ඇල්විටිගල, වික්ටර් රත්නායක, ඩබ්. ඩී. අමරදේව, ෂෙල්ටන් ප්‍රේමරත්න, ලයනල් අල්ගම, එඩ්වින් සමරදිවාකර, සරත් දසනායක, රෝහණ වීරසිංහ වැනි සංගීත නිර්මාණ ශිල්පීහු චිත්‍රපට සංගීතයේ නැවුම් අත්දැකීම් ලබා දෙන්නට සමත් වූ හ. ගීතය පමණක් ය යන සංකල්පයෙන් බැහැර ව පසුබිම් සංගීතය තෙක් විකාශනය වූ චිත්‍රපට සංගීතයක් ඔවුන් අපට දායාද කළේ ය.

මුල් යුගයේ බිහි වූ චිත්‍රපට 39 අතරින් රේඛාව චිත්‍රපටය හැර අනෙක් නිර්මාණ අතර අවස්ථෝචිත සංගීත නිර්මාණයක් ගැන සිතූ බවක් නොපෙනේ. එම නිර්මාණවල දක්නට ලැබුණේ නිහඬ බව නැති කිරීම, හිස් බව නැති කිරීම පිණිස විකට ශබ්ද යොදා ගැනීම වැනි ක්‍රියාකාරකම් ය. මෙම [illegible] ඉපැයීම හා හුදු විනෝදාස්වාදය පිණිස ම විය.

අනුකරණ චිත්‍රපට නිසා යහපත් මෙන් ම අයහපත් ප්‍රතිඵල ද ඇත. අපේ කියා සංගී[illegible] නොමැති කල පිළිගත් විවිධ සංගීත සම්ප්‍රදාය වල ඇසුර ලබා එම නිර්මාණ රස විඳීමෙන් රසිකත්වය දියුණු වේ. අයහපත නම් අනුන්ගෙන් යැපීම නිසා ස්වාධීන නිර්මාණකරුවන් බිහි නොවීම ය.

අනුකරණ ගීත අනුසාරයෙන් වුව ද රසවත් ගී තනු තෝරා ගත් බවට නිදසුන්

| දෙමළ/හින්දි චිත්‍රපටය | ගීතය | සිංහල චිත්‍රපටය | ගීතය |
|---|---|---|---|
| රත්තරත් | පරදේශී බාලා මා බාදල් ආයා | කඩවුණු පොරොන්දුව | සන්ධ්‍යාවේ ශ්‍රීය රම්‍යා ලෙස පේනා |
| තරාණා | තීන් මිලේ තීනු නුවේ බාවරේ | උමතු විශ්වාසය | සුදට සුදේ සිරිය දිලේ |
| ජාල් | අප්තිකහෝ කුච් මේරී සුනෝ | කැලෑ හඳ | අන්න සුදෝ අර පාට වලා |
| අම්බර් | හම්තුම් හේ බහාර් | සුජාතා | පෙම් රැල්ල නැගී |
| ශ්‍රී 420 | රමෙමයා වසාවයා | දෛව විපාකය | සාගර හිමිය සොයා |

1956 තිරගත වූ රේඛාව චිත්‍රපටය දේශීය නිර්මාණකරුවන් අතින් ස්වාධීන ගී තනු නිර්මාණය වූ ප්‍රථම සිංහල චිත්‍රපටය වූ අතර, 1957න් ඇරඹී දෙවන දශකය තුළ විජාතීය නිර්මාණකරුවන් හැරුණු කොට දේශීය අධ්‍යක්ෂවරු කිහිපදෙනෙක් චිත්‍රපට නිර්මාණකරණය එක් වූ හ.

1956 ඇති වූ ජාතික ව්‍යාපාරයත් සමඟ රටේ උද්ගත වූ දේශපාලන වාතාවරණය ද චිත්‍රපට කර්මාන්තය දේශීයත්වයට නැඹුරු කිරීමට හේතුවක් විය.

සිංහල චිත්‍රපට ගීත ඉතිහාසයේ ස්වතන්ත්‍ර ගී තනු නිර්මාණකරුවෝ කිහිප දෙනෙක් වෙති. ඔවුන්ගේ නිර්මාණ මගින් දේශීයත්වය ඉස්මතු වූවා මෙන් ම, ඉතා මධුර ගී තනු ද බිහි විය.

1. චිත්‍රපට සංගීතය යනු කුමක්ද? කෙටියෙන් විමසන්න.

2. ශ්‍රී ලංකාවේ චිත්‍රපට සංගීතය සඳහා ප්‍රබල දායකත්වයක් සැපයූ සංගීතඥයින් තිදෙනෙකු නම් කරන්න.

3. ඉන් එක් සංගීතඥයෙකු ගැන කෙටි හිඳින්වීමක් කරන්න.

4. සිංහල චිත්‍රපට සඳහා නිර්මාණය වූ අනුකාරක ගීත ලැයිස්තුවක් සකස් කරන්න.

4. ඔබ උගත් චිත්‍රපට ගීතයක් ගායනයට හා වාදනයට පුරුදු පුහුණු වන්න.